(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක **122.** ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2026 ජනවාරි 09 සිකුරාදා පූ. භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **(වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා,** කථානායකතුමා

ගරු **(වෛද්‍ය) රිස්වි සාලි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **හේමාලි වීරසේකර මහත්මිය,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය

---

ගරු **ආචාර්ය හරිනි අමරසූරිය,** අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය

ගරු **(මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා,** රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා,** විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා

ගරු **අනුර කරුණාතිලක මහතා,** වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **සුනිල් කුමාර ගමගේ මහතා,** තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා

ගරු **කුමාර ජයකොඩි මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,** සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **(ආචාර්ය) අනිල් ජයන්ත මහතා,** කම්කරු අමාත්‍යතුමා සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) දම්මික පටබැඳි මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **බිමල් රත්නායක මහතා,** ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **(ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **චතුරංග අබේසිංහ මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය,** ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **අර්කම් ඉල්යාස් මහතා,** බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග ගුණසේකර මහතා,** නාගරික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ආර්.එම්. ජයවර්ධන මහතා,** වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිශාන්ත ජයවීර මහතා,** ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්ද ජයසිංහ මහතා,** කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා,** ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුගත් තිලකරත්න මහතා,** ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගමගෙදර දිසානායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මුනීර් මුලාෆර් මහතා,** ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) රුවන් රණසිංහ මහතා,** සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සුනිල් වටගල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) හංසක විජේමුණි මහතා,** සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග වීරරත්න මහතා,** ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. සරත් මහතා,** නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා,** අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිනිඳු සමන් හෙන්නායක මහතා,** තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් හේවගේ මහතා,** වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **රොෂාන් අක්මීමන මහතා**

ගරු **අජිත් අගලකඩ මහතා**

ගරු **අබුබකර් අතම්බාවා මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**

ගරු **(මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**

ගරු **(වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**

ගරු ජේ.සී. අලවතුවල මහතා

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා

ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා

ගරු මංජුල සුරවීර ආරච්චි මහතා

ගරු බී. ආරියවංශ මහතා

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා

ගරු කේ. ඉලංකුමාරන් මහතා

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු ක්‍රිෂ්නන් කලෛයිචෙල්වි මෙනෙවිය

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා

ගරු උපුල් කිත්සිරි මහතා

ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය

ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා

ගරු චමින්ද ලලිත් කුමාර මහතා

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා

ගරු චතුර ගලප්පත්ති මහතා

ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය

ගරු අශෝක ගුණසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු රුවන්තිලක ජයකොඩි මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු දිලිත් ජයවීර මහතා

ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය

ගරු ටී.කේ. ජයසුන්දර මහතා

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා

ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා

ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා

ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු නන්දන පත්මකුමාර මහතා

ගරු අරුණ පනාගොඩ මහතා

ගරු අජිත් පී. පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා

ගරු කන්දසාමි ප්‍රභු මහතා

ගරු ලාල් ප්‍රේමනාත් මහතා

ගරු පද්මසිරි බණ්ඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු චානක මාදුගොඩ මහතා

ගරු රුවන් මාපලගම මහතා

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා

ගරු සංජීව රණසිංහ මහතා

ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා

ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා

ගරු මංජුල සුගත් රත්නායක මහතා

ගරු ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මහත්මිය

ගරු තුරෙරෙරාසා රවිකරන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා

ගරු මනෝජ් රාජපක්ෂ මහතා

ගරු සුනිල් රාජපක්‍ෂ මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය

ගරු දීප්ති වාසලගේ මහත්මිය

ගරු නයන වාසලතිලක මහතා

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා

ගරු කංචන වැලිපිටිය මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු ආර්.ජී. විජේරත්න මහතා

ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා

ගරු රුවන් විජේවීර මහතා

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය

ගරු ජගත් විතාන මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා

ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය

ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා

ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා

ගරු දේවානන්ද සුරවීර මහතා

ගරු චන්දන සූරියආරච්චි මහතා

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා

ගරු කිට්නන් සෙල්වරාජ් මහතා

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා

ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා

ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා

**ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා**

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**

**ගරු දිනේෂ් හේමන්ත මහතා**

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**

**ගරු රියාස් ෆාරුක් මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

චමින්ද කුලරත්න මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස් විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු සඳහන් නිවේදනය කරන ලදී:—

[පරිවර්තනය]

"අධිකරණ නිලධාරින් පත් කිරීම, උසස් කිරීම, මාරු කිරීම, සේවයෙන් පහ කිරීම සහ ඔවුන් විෂයෙහි විනය පාලනය සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන බලතල පරීක්ෂා කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කිරීම පිළිබඳ යෝජනාව සම්බන්ධයෙන්, 27(3) ස්ථාවර නියෝගය යටතේ ගරු කථානායකවරයා විසින් 2025 නොවැම්බර් 21 වන දින ලබා දෙන ලද තීරණය

ගරු මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරයෙකු විසින් ඉදිරිපත් කරනු ලබන කිසියම් යෝජනාවක් සම්බන්ධයෙන් වූ දැනුම්දීමක් පිළිතුරු ලබා දීම සඳහා න්‍යාය පුස්තකයට ඇතුළත් කළ යුතු ද යන්න තීරණය කිරීමේ දී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27(3) යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව, ගරු සජිත් ප්‍රේමදාස, ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර, ගරු නීතිඥ දයාසිරි ජයසේකර, ගරු ගයන්ත කරුණාතිලක, ගරු අජිත් පී. පෙරේරා, ගරු ඩී. වී. චානක, ගරු දිලිත් ජයවීර, ගරු රිෂාඩ් බදියුදීන්, ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් සහ ගරු චාමර සම්පත් දසනායක ඇතුළු මන්ත්‍රීවරුන් 31 දෙනෙකු විසින් 2025 නොවැම්බර් 21 වන දින ඉදිරිපත් කරන ලද යෝජනාවක් (**මෙහි මින්මතු 'යෝජනාව' යනුවෙන් සඳහන් කරනු ලබන**) පිළිබඳව සලකා බලා මම මෙසේ ප්‍රකාශ කරමි.

අධිකරණ නිලධාරින් පත් කිරීම, උසස් කිරීම, මාරු කිරීම, සේවයෙන් පහ කිරීම සහ ඔවුන් විෂයෙහි විනය පාලනය සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන ලද බලතල පරීක්ෂා කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කරන ලෙස ඉල්ලා සිටිමින් මෙම යෝජනාව ඉදිරිපත් කර තිබේ.

මෙම යෝජනාව මඟින් මතු කරනු ලබන බරපතල නීතිමය හා මූලධර්ම ආශ්‍රිත ගැටලු ද, එමඟින් ඇති විය හැකි ප්‍රතිවිපාකද සැලකිල්ලට ගනිමින්, පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 27(3) යටතේ මා විසින් ගන්නා ලද තීරණයට හේතු වූ කරුණු පිළිබඳ සවිස්තරාත්මක කරුණු දැක්වීමක් සිදු කිරීමට මම අදහස් කරමි.

ප්‍රථමයෙන්ම, පාර්ලිමේන්තු ඉතිහාසයේ පළමුවැනි වරට, 2001 ජුනි මස 20 වන දින, එවකට පාර්ලිමේන්තුවේ කථානායකවරයා වූ ගරු අනුර බණ්ඩාරනායක මහතා විසින් මීට සමාන තීරණයක් ලබා දී ඇති බව සඳහන් කළ යුතු ය. 2001 වසරේ දී ලබා දුන් එම තීරණය, එවක සිටි අගවිනිසුරුවරයාට එරෙහිව ඉදිරිපත් කර තිබූ දෝෂාභියෝග යෝජනාවක් සම්බන්ධයෙන් කතානායකවරයා විසින් පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කිරීම වළක්වමින් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දෙනු ලැබූ නියෝගයක් හා සම්බන්ධ වූවක් විය. 2001 වසරේ දී ලබා දෙන ලද තීරණය තුළ ඇගයීමට ලක් කරන ලද සිද්ධිමය කරුණු සමඟ මෙම අවස්ථාවට අදාළ කරුණු සමාන කළ නොහැකි වුව ද, 2025 නොවැම්බර් 21 වන දින ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකු විසින් ඉදිරිපත් කරන ලද මෙම යෝජනාව, බලතල බෙදීමේ මූලධර්මය වෙත මෙම සභාවේ කැපවීම නැවත තහවුරු කිරීම සඳහා ඒ හා සමානවම වැදගත් හා තීරණාත්මක අවස්ථාවක් සලසනු ඇති බව මාගේ විශ්වාසයයි.

2001 වසරේ දී ලබා දෙන ලද තීරණය මඟින්, පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කිරීම සඳහා පහසුකම් සැලසීමේ දී කථානායකවරයාගේ කාර්යභාරය පිළිබඳව අවධානය යොමු කර, එවැනි ක්‍රියාවලියක් අධිකරණය විසින් පාලනය කළ හැකි ද යන්න පිළිබඳ ප්‍රශ්නය ද මතු කරන ලද අතර වත්මන් යෝජනාව මඟින් එයට ප්‍රතිවිරුද්ධ ප්‍රශ්නයක් මතු කරනු ලැබේ. එනම්, අධිකරණ සේවා කොමිෂන් සභාව සඳහා අධීක්ෂණ යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම මඟින්, කථානායකවරයාට සහ ඒ හරහා පාර්ලිමේන්තුවට, අධිකරණයේ බලතල පාලනය කිරීමට අවසර දිය යුතු ද යන්නයි.

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට පෙර, 2025 නොවැම්බර් 21 වන දින ඉදිරිපත් කරන ලද යෝජනාවේ අන්තර්ගතය පිළිබඳව පැහැදිලි කිරීමට බලාපොරොත්තු වෙමි.

අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබන, අධිකරණ නිලධාරින්ගේ පත් කිරීම, උසස් කිරීම, මාරු කිරීම, සේවයෙන් පහ කිරීම සහ ඔවුන් විෂයෙහි විනය පාලනය සම්බන්ධ බලතල පිළිබඳව විමර්ශනය කිරීම සහ පහත සඳහන් ගැටලු ඇගයීමට ලක් කරමින් වාර්තාවක් සකස් කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කරන ලෙස මෙම යෝජනාව මඟින් ඉල්ලුම් කරනු ලැබේ:—

I. 2025 ජනවාරි 1 වන දින සිට මේ දක්වා කාලය තුළ අධිකරණ නිලධාරින්ගේ සියලුම පත්වීම්, උසස්වීම්, මාරු කිරීම්, සේවයෙන් පහ කිරීම් සහ ඔවුන් විෂයෙහි විනය පාලනය සම්බන්ධව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් බලතල ක්‍රියාත්මක කිරීම;

II. එවැනි පත්වීම්, උසස්වීම්, මාරු කිරීම්, සේවයෙන් පහ කිරීම් සහ විනය පාලනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, ස්වාභාවික යුක්තියේ මූලධර්ම සහ අධිකරණ සේවා කොමිෂන් සභාවේ අනෙකුත් අදාළ නීති හෝ මාර්ගෝපදේශ අනුව සිදු කර තිබේද යන බව;

III. නීතියේ විධිවිධානයන්ට යටත්ව සහ පක්ෂපාතී බවකින් තොරව හේතු වාර්තා කර අදාළ අධිකරණ නිලධාරින්හට දැනුම් දී තිබේද යන බව;

IV. අධිකරණ නිලධාරින්ගේ ස්ථාන මාරුවීම්, සේවයෙන් පහ කිරීම් හෝ ඔවුන් විෂයෙහි විනය පාලනය පිළිබඳ තීරණයක එළඹීමට පෙර, එකී අධිකරණ නිලධාරින් සමඟ සාකච්ඡා කිරීම සඳහා ඉඩ ප්‍රස්ථා සලසන ලද්දේද යන බව;

V. අධිකරණ නිලධාරීන්ගේ පත්වීම්, උසස්වීම්, ස්ථාන මාරුවීම්, සේවයෙන් පහ කිරීම් සහ ඔවුන් විෂයෙහි විනය පාලනය පිළිබඳ තීරණ ගැනීමේදී, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් බාහිර කරුණු සැලකිල්ලට ගනු ලැබුවේ ද යන බව;

VI. එසේ නම්, අධිකරණයේ ස්වාධීනත්වය, යුක්තිය පසිඳලීම සහ අධිකරණය කෙරෙහි මහජනතාවගේ විශ්වාසය සම්බන්ධයෙන් එවැනි සලකා බැලීම්වල බලපෑම කවරේ ද;

VII. අධිකරණ සේවා කොමිෂන් සභාව හරහා අක්‍රමවත් පත්වීම්, උසස්වීම්, මාරු කිරීම්, සේවයෙන් පහ කිරීම් සහ විනය පාලනයට එරෙහිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සහ ව්‍යවස්ථාපිත සංශෝධන, පරිපාලන මාර්ගෝපදේශ සහ අභියාචනා යාන්ත්‍රණ සඳහා වන නිර්දේශ

යෝජනාවේ සඳහන් අරමුණු පිළිබඳව සැකෙවින් විමසා බැලීමේ දී පෙනී යන්නේ, යෝජිත පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව විසින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ක්‍රියාකාරිත්වය සහ එහි මෙහෙයුම් කටයුතු පිළිබඳව අනිවාර්ය අධීක්ෂණ කාර්යයක් ඉටු කරනු ලබන බවයි. පත්වීම්, උසස්වීම්, මාරුවීම්, සේවයෙන් පහ කිරීම් සහ විනය පාලනය පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාවේ තීරණ පරීක්ෂා කිරීමෙන්, යෝජිත කාරක සභාව විසින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ මෙහෙයුම් සඳහා මැදිහත් වනු ඇති අතර එය අධීක්ෂණ කාර්යයක හරය වේ.

අධීක්ෂණ භූමිකාවක් තුළින් ව්‍යුහාත්මකව ධූරාවලි සම්බන්ධතාවක් උපකල්පනය කරනු ලැබේ - එනම්, තවත් කෙනෙකුගේ ක්‍රියාවන් සමාලෝචනය කිරීමට, මෙහෙයවීමට හෝ නිවැරදි කිරීමට බලය ඇති නියාමකයකු ලෙස ක්‍රියා කරනු ලැබේ. මෙමඟින් ඊට අනුබද්ධ ප්‍රශ්න දෙකක් මතු කරනු ලැබේ - නියාමනය කිරීමට උත්සාහ කරන යාන්ත්‍රණයේ (මෙම අවස්ථාවේ දී අධිකරණ සේවා කොමිෂන් සභාවේ) ස්වභාවය සහ එහි ලක්ෂණ මොනවා ද? යන්න සහ එවැනි නියාමනය කිරීම් ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නීතියට සහ හරයට අනුකූල වේ ද? යන්නයි.

පළමු ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීමේ දී, ප්‍රථමයෙන් දහහත්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ දහනවවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ එහි ස්වභාවය මඟින් අධිකරණ සේවා කොමිෂන් සභාව හඳුන්වාදීම පිළිබඳව සඳහන් කිරීමට කැමැත්තෙමි.

අධිකරණ සේවා කොමිෂන් සභාව යන මාතෘකාව යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVඅ වන පරිච්ඡේදය පළමුවෙන්ම හඳුන්වා දෙන ලද්දේ දහහත්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟිනි. අනතුරුව, දහනවවැනි සහ විසි එක්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන මඟින් ද එම පරිච්ඡේදය ඇතුළත් කරගන්නා ලදී. වර්තමාන තත්ත්වය පරිදි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත්ව, අග්‍ර විනිශ්වයකාරවරයා (අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති) සහ ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨතම විනිශ්වයකාරවරයන් දෙදෙනාගෙන් සමන්විත වන අධිකරණ සේවා කොමිෂන් සභාව පිහිටුවීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඇ ව්‍යවස්ථාව මඟින් විධිවිධාන සලසා ඇත. අධිකරණ නිලධාරීන් පත් කිරීම, උසස්, කිරීම, මාරු කිරීම, ඔවුන් විෂයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම සහ සේවයෙන් ඉවත් කිරීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව සතු බලතල 111ඌ ව්‍යවස්ථාව තුළ දක්වා ඇත. අධිකරණ සේවා කොමිෂන් සභාව නඩු කටයුතුවලින් මුක්ත බව 111ඔ ව්‍යවස්ථාව තුළ තවදුරටත් දක්වා ඇති අතර අධිකරණ සේවා කොමිෂන් සභාවේ තීරණවලට අයුතු ලෙස මැදිහත්වීම පැහැදිලිවම වරදක් බව 111ඕ ව්‍යවස්ථාව මඟින් දක්වා ඇත.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ සංයුතිය සහ ඊට පවරා ඇති කාර්යයන් යන සාධක දෙකටම අදාළව එහි මෙහෙයුම් කටයුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 4(ඇ) ව්‍යවස්ථාව යටතේ අපේක්ෂිත පරිදි ජනතාවගේ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම සහ එයට සාරෝපණය වන කාරණයක්ය යන්න මාගේ අදහසයි.

අධිකරණ සේවා කොමිෂන් සභාව, රජයේ අධිකරණ අංශයේ අනිවාර්ය අංගයක් වන අතර විධායකයට හෝ ව්‍යවස්ථාදායකයට යටත් පරිපාලන ආයතනයක් නොවේ. ජනරජයේ සියලුම අධිකරණ නිලධාරින් පත් කිරීම, උසස් කිරීම, මාරු කිරීම, සේවයෙන් පහ කිරීම, ඔවුන් විෂයෙහි විනය පාලනය සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත බලය පවරා ඇති අතර අධිකරණයේම ආයතනික දිගුවක් ලෙස එය ක්‍රියා කරයි. අධිකරණයේ ඉහළම නායකත්වය හරහා එනම්, අග්‍රවිනිශ්චයකාරවරයා හරහා ක්‍රියාත්මක කෙරෙන අධිකරණ සේවා කොමිෂන් සභාවේ බලතල, කොමිෂන් සභාවේ කාර්යභාරය රජයේ අධිකරණ අංශය වෙත නිසි ලෙස ආරෝපණය කළ හැකි බව තහවුරු කෙරේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඇ, 111ඌ, 111ඔ, 111ඕ ව්‍යවස්ථා පිළිබඳව හොඳින් සලකා බැලීමේ දී, අධිකරණ සේවා කොමිෂන් සභාව පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම රජයේ අධිකරණ අංශයේ කොටසක් වන අතර ජනතාවගේ අධිකරණ බලය ක්‍රියාත්මක කරන්නක් බව පැහැදිලි වේ.

ඊට අමතරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව යන ශීර්ෂය යටතේ VII අ වන පරිච්ඡේදය තුළ 41ඇ ව්‍යවස්ථාව මඟින් දක්වා ඇති පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතියකින් තොරව ජනාධිපතිවරයා විසින් අධිකරණ සේවා කොමිෂන් සභාවට කිසිදු පුද්ගලයෙකු පත් නොකළ යුතු වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත පත් කිරීම් සිදු කරනු ලබන අනෙකුත් කොමිෂන් සභා පිළිබඳව ද එම පරිච්ඡේදයේ සඳහන් වේ. එසේ පාර්ලිමේන්තුවට පිළිතුරු දීමට බැඳී සිටින කොමිෂන් සභා ලැයිස්තුවක් 41ආ ව්‍යවස්ථාවෙහි පැහැදිලිව දක්වා තිබේ. කෙසේ වෙතත්, අධිකරණ සේවා කොමිෂන් සභාව පිළිබඳව එහි සඳහන් කර නොමැත. මේ ආකාරයට එකී කොමිෂන් සභා ලැයිස්තුව තුළ අධිකරණ සේවා කොමිෂන් සභාව පිළිබඳව සඳහන් නොකිරීම මඟින්, ජනතාවගේ අධිකරණ බලයේ දිගුවක් ලෙස අධිකරණ සේවා කොමිෂන් සභාව විධායකයෙන් සහ ව්‍යවස්ථාදායකයෙන් ස්වාධීනව පවතින බව අවධාරණය කරනු ලැබේ.

එබැවින්,— යෝජනාව මඟින් නියාමනය කිරීමට උත්සාහ කරන්නේ කුමක් ද යන - පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී එය ජනතාවගේ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමක් ලෙස සඳහන් කරනු ලැබිය හැකි ය.

මීළඟට, තීරණය කළ යුතු කාරණය වන්නේ පාර්ලිමේන්තුව විසින් විශේෂ කාරක සභාවක් හරහා අධිකරණ සේවා කොමිෂන් සභාව සහ එහි මෙහෙයුම්, එනම් ජනතාවගේ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කළ හැකි ද යන වගයි. මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී, ඒ සඳහා මඟ පෙන්වනු ලබන මූලධර්මය වන්නේ බලතල බෙදීමේ මූලධර්මයයි.

රාජ්‍යයේ ප්‍රධාන අංගයන් (විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය) වෙන වෙනම පවතින සහ ස්වාධීන ආයතන ලෙස ස්ථාපිත කළ යුතු බව බලතල බෙදීමේ මූලධර්මයේ සඳහන් වේ. බලතල බෙදීම පිළිබඳ මුල්ම සහ පැහැදිලි ප්‍රකාශයක් 1748 වසරේ දී

**මොන්ටෙස්කියු** විසින් ලබා දෙන ලදී (The Spirit of Laws[1]): *ව්‍යවස්ථාදායක සහ විධායක බලතල එකම පුද්ගලයෙකු තුළ හෝ එකම මහෙස්ත්‍රාත් මණ්ඩලයක් තුළ එක්රැස් වූ විට, එහි නිදහසක් තිබිය නොහැකි ය ... විනිශ්චය කිරීමේ බලතල ව්‍යවස්ථාදායක සහ විධායකයෙන් වෙන් නොකළහොත් නිදහසක් නොමැත ... එකම මිනිසා හෝ එකම ආයතනය ... එම බලතල තුන ක්‍රියාත්මක කළහොත් එය සියල්ලෙහිම අවසානය වනු ඇත.*

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිලෝම වශයෙන් 3 සහ 4 ව්‍යවස්ථාවන්ට අනුව බලතල බෙදීමේ මූලධර්මය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ දක්වා ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 ව්‍යවස්ථාව තුළ දක්වා ඇති පරිදි "ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපත්‍යය ජනතාව කෙරෙහි පිහිටා ඇත්තේ ය. පරමාධිපත්‍ය අත්හළ නොහැක්කේ ය. පරමාධිපත්‍යයට පාලන බලතල, මූලික අයිතිවාසිකම් සහ ඡන්ද බලය ඇතුළත් වන්නේ ය.". එවැනි බලයක් ක්‍රියාත්මක කළ යුතු ආකාරය 4 ව්‍යවස්ථාව තුළ දැක්වේ:

"ජනතාවගේ පරමාධිපත්‍යය ක්‍රියාත්මක වීම ද, භුක්ති විඳීම ද, මතු දැක්වෙන ආකාරයෙන් සිදුවන්නේ ය:—

(අ) ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ජනතාව විසින් තෝරා පත්කර ගනු ලබන මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත පාර්ලිමේන්තුව විසින් ද, ජනමත විචාරණයක දී ජනතාව විසින් ද ක්‍රියාත්මක කළ යුත්තේ ය;

(ආ) රටේ ආරක්ෂාව ඇතුළුව ජනතාවගේ විධායක බලය ජනතාව විසින් තෝරා පත්කර ගනු ලබන ජනරජයේ ජනාධිපතිවරයා විසින් ක්‍රියාත්මක කළ යුත්තේ ය;

(ඇ) නීතිය අනුව පාර්ලිමේන්තුව විසින් ම ක්‍රියාත්මක කළ හැකි පාර්ලිමේන්තුවේ සහ එහි මන්ත්‍රීවරයන්ගේ වරප්‍රසාද, පරිහාර හා බලතල සම්බන්ධයෙන් විනා ජනතාවගේ අධිකරණ බලය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඇති කොට පිහිටුවන ලද හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගන්නා ලද නැතහොත් වෙනත් යම් නීතියකින් ඇති කොට පිහිටුවන ලද අධිකරණ, විනිශ්චය අධිකාර සහ ආයතන මඟින් පාර්ලිමේන්තුව විසින් ක්‍රියාත්මක කළ යුත්තේ ය;

(ඈ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගනු ලබන මූලික අයිතිවාසිකම් සියලු පාලන ආයතන විසින් ගරු කරනු ලැබිය යුත්තේ ය; ආරක්ෂා කරනු ලැබිය යුත්තේ ය; වර්ධනය කරනු ලැබිය යුත්තේ ය. තව ද, ඒ මූලික අයිතිවාසිකම් මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට සහ ප්‍රමාණයට මිස සංක්ෂිප්ත කිරීම, සීමා කිරීම හෝ අහිමි කිරීම නොකළ යුත්තේ ය;

(ඉ) අටළොස් විය සම්පූර්ණ කර ඇත්තා වූ ද, මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි ඡන්දහිමියකු වීමට සුදුසුකම් ලැබ තමාගේ නම ඡන්දහිමි නාමලේඛනයේ ඇතුළත් කරනු ලැබ සිටින්නා වූ ද, සෑම පුරවැසියකු විසින් ම ජනරජයේ ජනාධිපතිවරයා තෝරා පත් කිරීමේ ඡන්ද විමසීමේ දී ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කිරීමේ මැතිවරණයේ දී ද, සෑම ජනමත විචාරණයක දී ද ඡන්ද බලය ක්‍රියාත්මක කළ හැකි විය යුතු වන්නේය."

එකී කාර්යය සඳහා, **ජාතික සේවක සංගමය එදිරිව ශ්‍රී ලංකා හඳුනුම්පත් අධිකාරිය** (2015) 1 SLR 258 නඩුවේ දී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් බලතල බෙදීමේ මූලධර්මය පිළිබඳව මෙසේ සඳහන් කරන ලදී:—

"*රාජ්‍යයක රජයකට සම්බන්ධ වන සුවිශේෂ කාර්යයන් තුනක් තිබේ - එනම්, ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ කාර්යයන් ය. එම ආයතන ත්‍රිත්වය ව්‍යවස්ථානුකූලව සමාන*

---

[1] Translated by Anne Cohler, Basia Miller, Harold Stone. (New York: Cambridge University Press, 1989)

*තත්ත්වයක් උසුලන අතර, ඒවා එකිනෙකාගෙන් ස්වාධීන ද වේ. එක් ආයතනයක් විසින් රජයේ තවත් ආයතනයක බලතල සහ කාර්යයන් පාලනය කිරීම හෝ ඒවාට මැදිහත් වීම සහ බලපෑම් කිරීම නොකළ යුතු අතර අනෙක් ආයතනයන් සම්බන්ධයෙන් ආධිපත්‍යය දැරීමට හැකියාවක් ද නොතිබිය යුතුය.*

*බලතල බෙදීමේ මූලධර්මය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 4 ව්‍යවස්ථාව තුළ ඇතුළත් කර ඇත - 3 ව්‍යවස්ථාව 4 ව්‍යවස්ථාව හා සම්බන්ධව ඇත.*"

ශ්‍රේෂ්ඨාධිකරණය සම්බන්ධයෙන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 116 ව්‍යවස්ථාව, "*අධිකරණයේ ස්වාධීනත්වය, අධිකරණ නිලධාරින්ට ඔවුන්ගේ බලතල සහ කාර්යයන් කිසිදු මැදිහත්වීමකින් තොරව ඉටු කිරීමට හැකි වන ඇතැම් ආරක්ෂණ*" පිළිබඳ පිළිගැනීමක් ලෙස එම තීන්දුව තුළම සඳහන් කරනු ලැබ ඇත. "කවර ආකාරයක හෝ මැදිහත්වීමකින් තොරව ස්වාධීනව අධිකරණය පැවතිය යුතු බව සහතික කිරීමේ අභිලාෂය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඇ ව්‍යවස්ථාව මඟින් පැහැදිලි කරනු ලබන බව" 111ඇ ව්‍යවස්ථාව පිළිබඳව සාකච්ඡා කරමින්, තීන්දුව මඟින් ගෙන හැර දක්වනු ලැබේ.

මෙම අවස්ථාවේ දී, "ජනතාවගේ අධිකරණ බලය අධිකරණය මඟින් පාර්ලිමේන්තුව විසින් ක්‍රියාත්මක කළ යුත්තේ ය ..." යන බවට විධිවිධාන සලසන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 (ඇ) ව්‍යවස්ථාවේ සැකැස්ම පිළිබඳව සැලකිල්ලට ගැනීම අදාළ වේ. සත්‍ය වශයෙන්ම, මෙම යෝජනාව තුළ සඳහන් වනුයේ අධිකරණ සේවා කොමිෂන් සභාවේ මෙහෙයුම් සඳහා පහසුකම් සැලසීම සඳහා ඒකාබද්ධ අරමුදලෙන් අරමුදල් වෙන් කිරීම සඳහා පාර්ලිමේන්තුව සතු වගකීම සහ ඉන් අනතුරුව ඇති වන එවැනි අරමුදල් වෙන් කිරීමක වියදම් සම්බන්ධයෙන් විනිවිදභාවය සහ වගවීම සහතික කිරීමේ අවශ්‍යතාවයයි.

කෙසේ වෙතත්, මහජනතාව විසින් භාරයක් ලෙස රජයේ අරමුදල් පිළිබඳ භාරකාරිත්වය පාර්ලිමේන්තුවට පැවරීම මඟින් භාරකාර වගකීමක් මිස ධූරාවලි ආධිපත්‍යයක් පවරනු ලැබ නොමැති අතර ව්‍යවස්ථාපිත බලතල බෙදීම ස්වයංක්‍රීයව ආක්‍රමණය කිරීම සහ අධිකරණයේ ස්වාධීනත්වයට හානියක් සිදු කිරීම සාධාරණීකරණය කළ නොහැකි බව මගේ අදහසයි. සත්‍ය වශයෙන්ම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ තීරණ සමාලෝචනය කිරීම සඳහා අවසර ලත් එක් මාර්ගයක් පමණක් - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 ව්‍යවස්ථාව යටතේ මූලික අයිතිවාසිකම් අධිකරණ බලය වෙත යොමු වීම - සපයනු ලැබේ.

තවද, අධිකරණයේ ස්වාධීනත්වය මඟින් විනිසුරුවන් වෙත පනවන ඕනෑම ආකාරයක දේශපාලන වගවීමක් තහනම් කරන බව මහජන මන්ත්‍රී මණ්ඩලය තුළ මනා ලෙස තහවුරු කරනු ලැබ ඇති ව්‍යවස්ථාමය සම්මුතියක් වේ. *අර්ස්කින් මේ ගේ පාර්ලිමේන්තු පරිචය තුළ* දක්වා ඇති ව්‍යවස්ථාමය මූලධර්මවලට අනුකූලව සහ අධිකරණයේ ස්වාධීනත්වය සහ බලතල වෙන් කිරීම පිළිබඳ මූලධර්ම මත පදනම් වූ, නීතිමය ස්ථාවරය ඉතා පැහැදිලි ය: එවැනි කමිටුවක් පිහිටුවීම ව්‍යවස්ථා විරෝධී සහ දිගුකාලීන පාර්ලිමේන්තු සම්ප්‍රදායන්ට පටහැනි වනු ඇත යන්න *අර්ස්කින් මේ* ගේ අදහසයි. අධිකරණ ස්වාධීනත්වය මූලික ව්‍යවස්ථාමය සම්මුතියක් බවත්, පාර්ලිමේන්තුවේ කටයුතු මඟින් "අධිකරණ ස්වාධීනත්වයට හානි නොකළ යුතු" බවත් *අර්ස්කින් මේ* තවදුරටත් සඳහන් කරයි.

අධිකරණය, දේශපාලන ආයතනයක් වන විශේෂ කාරක සභාවක් ඉදිරියට පැමිණවීම මඟින් විනිසුරුවරුන් හෝ අධිකරණ පරිපාලකයින් දේශපාලන පරීක්ෂාවට ලක් කරනු ඇති අතර එමඟින් අධිකරණ අංශයට අතිශය අත්‍යවශ්‍ය ස්වාධීනත්වය අඩපණ කරනු ලැබේ.

අධිකරණය සහ පාර්ලිමේන්තුව රජයේ "**වෙනම සහ ස්වාධීන**" ආයතන බව *අර්ස්කින් මේ* සඳහන් කරයි. අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම හෝ අධිකරණ ක්‍රියා සමාලෝචනය කිරීම, අධීක්ෂණය කිරීම හෝ පාලනය කිරීම කිසිදු මන්ත්‍රී මණ්ඩලයක් විසින් සිදු කළ නොහැකි ය. පත් කිරීම, විනය කටයුතු, නඩු නියම කිරීම සහ අභ්‍යන්තර පාලනය ඇතුළු අධිකරණයේ පරිපාලනය අධිකරණ ස්වාධීනත්වය සඳහා අත්‍යාවශ්‍ය අංගයක් වේ.

එබැවින්, අධිකරණයේ පරිපාලන තීරණ සම්බන්ධයෙන් පාර්ලිමේන්තු පරීක්ෂාවක් සිදු කිරීම මඟින් ව්‍යවස්ථානුකූල බලතල බෙදීම උල්ලංඝනය කරනු ලබන බව මැනවින් පැහැදිලි වේ.

මෙම යෝජනාව සඳහා ප්‍රාමාණික ඉංග්‍රීසි නඩු තීන්දු මඟින් තවදුරටත් සහාය ලැබේ; විශේෂයෙන්ම, **M v Home Office** [1994] 1 AC 377 සහ **Duport Steels Ltd v Sirs** [1980] 1 WLR 142, මඟින් බලතල බෙදීමේ මූලධර්මය සහ අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමේ ව්‍යවස්ථාමය අත්‍යවශ්‍යතාවය පැහැදිලි ලෙස නැවත නැවතත් තහවුරු කරනු ලැබේ.

එක්සත් රාජධානියේ මෙන් නොව, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ පවා, බලතල බෙදීමේ මූලධර්මය මූලික ව්‍යවස්ථාමය මූලධර්මයක් ලෙස ප්‍රකාශිතවම සහ පැහැදිලි ලෙස පිළිගැනීමට ලක් කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ ඉහළම අධිකරණ විසින් මෙම ස්ථාවරය නැවත නැවතත් තහවුරු කරනු ලැබ තිබේ. **ප්‍රේමචන්ද්‍ර එදිරිව මේජර් මොන්ටේගු ජයවික්‍රම** (1994) 2 SLR 90 නඩුවේදී, 3 සහ 4 ව්‍යවස්ථා තුළ අන්තර්ගත බලතල බෙදීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික ලක්ෂණයක් වන බවත්, විධායකයට හෝ ව්‍යවස්ථාදායකයට අධිකරණ බලය අත්පත් කර ගැනීමට හෝ ආක්‍රමණය කිරීමට නොහැකි බවත් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අවධාරණය කරන ලදී. අධිකරණ පරිපාලනය පිළිබඳ ඕනෑම ආකාරයක පාර්ලිමේන්තු අධීක්ෂණයක් ව්‍යවස්ථා විරෝධී බවට පත් කරමින්, රජයේ සෑම අංශයක්ම *"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නියම කර ඇති සීමාවන් තුළ"* දැඩි ලෙස ක්‍රියාත්මක විය යුතු බව අග්‍රවිනිශ්චයකාර ෂර්වානන්ද මහතා විසින් අවධාරණය කරන ලදී. ඒ හා සමානව, **විසුවලිංගම් එදිරිව ලියනගේ** (1983) 1 SLR 203 නඩුවේදී, අදාළ ප්‍රස්තුත ගැටලුව වූයේ අධිකරණයට අපහාස කිරීම වුවද, අධිකරණයේ ස්වාධීනත්වය අත්‍යාවශ්‍ය ව්‍යවස්ථාමය මූල සත්‍යයක් බවත්, අධිකරණය රජයේ අනෙකුත් අංශයන් මඟින් පීඩනයට, බලපෑමට හෝ පාලනයට යටත් කළ නොහැකි බවත් අධිකරණය විසින් නැවතත් අවධාරණය කරන ලදී. *වාර්තා වූ බොහෝමයක් නඩු වලදී* මෙම මූලධර්මය නැවත නැවතත් තහවුරු කරන ලද අතර අධිකරණය විධායකයේ හෝ ව්‍යවස්ථාදායකයේ කිසිදු ආකාරයක විමර්ශනයකින් හෝ මැදිහත්වීමකින් සම්පූර්ණයෙන්ම නිදහස්ව පැවතිය යුතු බවට මෙහිදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීන්දු කරනු ලැබූ අතර, ජනතාවගේ ස්වෛරීභාවය ආරක්ෂා කිරීම සඳහා අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම අත්‍යවශ්‍ය බව ද එහි දී සඳහන් කෙරිණි. අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් අධිකරණ පරිපාලනය සම්බන්ධයෙන් සුවිශේෂ ව්‍යවස්ථාමය අධිකාරියක් භුක්ති විඳින බව අධිකරණය විසින් *තීරණය* කරනු ලැබූ අතර*, වාර්තා වූ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු බොහෝමයක් මඟින්* මෙය තවදුරටත් තහවුරු කරනු ලැබේ.

මෑතකදී අවසන් කරන ලද **අධිකරණ නිලධාරීන්ගේ බදු නඩුවේ** සඳහන් (CA රිට් 35/2023-36/2023, & 73/2023 C.A. කාර්ය සටහන්, 2023 නොවැම්බර් 27) පහත දැක්වෙන ඡේද මඟින් - අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කරන අතරම ශක්තිමත් ව්‍යවස්ථාදායක සහ විධායක අධිකාරියක් සහතික කරමින් - සෑම අංශයක්ම විසින් තම බලතල වගකීමෙන් යුතුව, සීමාවන් ඉක්මවා නොයමින්, සමාජයේ යහපැවැත්ම සඳහා භාවිතා කරනු පිණිස - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පරමාධිපත්‍යය ජනතාවට අයත් වන බවත්, විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය හරහා එය ක්‍රියාත්මක කිරීම බලතල බෙදීමක් තුළ දැඩිව ක්‍රියාත්මක විය යුතු බවත් පැහැදිලි කරනු ලැබේ.

එහි මෙසේ සඳහන් වේ –

*"…………ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව රටේ උත්තරීතර නීතිය වන අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 ව්‍යවස්ථාව අනුව, පරමාධිපත්‍යය ජනතාව කෙරෙහි පිහිටා ඇත්තේ ය. පරමාධිපත්‍යය අත්හළ නොහැක්කේ ය. පරමාධිපත්‍යයට පාලන බලතල ඇතුළත් වේ; එබැවින්, ජනතාවගේ බලය රජයේ කුළුණු තුන වන විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය හරහා ක්‍රියාත්මක වේ. එබැවින්, අධිකරණය යනු ජනතාවගේ අධිකරණ බලය ක්‍රියාත්මක කරන රජයේ එවැනි එක් කුළුණකි……………*

*………රජයේ කුළුණු තුන මඟින් සම්මත කරනු ලදුව ක්‍රියාත්මක කරන ලද නීති මඟින් බඳුකරණය නියාමනය කිරීම සමාජයේ උපරිම යහපත උදෙසා ඉවහල් වේ. කෙසේ වෙතත්, එවැනි කාර්යයක් ඉටු කිරීමේ සඵලභාවය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ අන්තර්ගත බලතල වෙන් කිරීමේ මූලධර්මය තුළ සඳහන් වේ. උගත් නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා විසින් සිදු කරන ලද කරුණු දැක්වීමේ දී සඳහන් කරනු ලැබූ පරිදි "මුදල් පසුම්බිය ව්‍යවස්ථාදායකය සතුව ද, කඩුව විධායකය සතුව ද, මහජන විශ්වාසය අධිකරණය සතුව ද ඇත." මෙය සටන් පාඨයකට සමාන වුවද, එමඟින් රාජ්‍ය පද්ධතියක් තුළ බලතල වෙන් කිරීම පිළිබඳව මැනවින් පැහැදිලි කරනු ලැබේ.* ***ඒ අනුව, රජයේ අංශ තුන එකිනෙකාගෙන් ස්වාධීනව ක්‍රියාත්මක විය යුතු අතර, එකිනෙකා විසින් එකිනෙකා වෙත මැදිහත් වීමක් සිදු නොවිය යුතු ය.*** *මෙම අංශ තුන අතර සංවරණ හා සංතුලන පැවතිය යුතු ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ලබා දෙනු ලබන මෙම මූලධර්මය මඟින් අධිකරණයේ ස්වාධීනත්වය සියුම් සංතුලනයක් මඟින් ආරක්ෂා කරනු ලැබේ.*

*…………සමකාලීන සමාජය නිරන්තරයෙන් වෙනස් වෙමින් පවතින අතර, සෑම දිනකම නව සමාජ වෙනස්වීම් සහ අභියෝග මතු වේ. මෙම ගැටලු ඵලදායි ලෙස විසඳීමට සහ ධනාත්මක වෙනසක් සහතික කිරීම සඳහා, බලයේ සිටින තැනැත්තන්හට ඒ සඳහා අවශ්‍ය මෙවලම් සහ අධිකාරී බලය තිබිය යුතු ය. මෙයින් අදහස් කරනු ලබන්නේ, රජයේ ව්‍යවස්ථාදායක සහ විධායක බලයට අනවශ්‍ය බාධා කිරීම් හෝ මැදිහත්වීම් වලින් තොර ප්‍රමාණවත් සහ සැලකිය යුතු තරමේ බලතල පැවතිය යුතු බවයි. මෙම බලතල ඔවුන්ට ජනතාව විසින් ලබා දී ඇති බව මතක තබා ගැනීම වැදගත් වන අතර, මෙම විශ්වාසය සමඟ ඔවුන් විසින් යුක්තිය පිළිබඳ හැඟීමකින් සහ ජනතාවගේ යහපත සඳහා වගකීමෙන් යුතුව සිය බලතල භාවිතා කරනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ ………….*

*…………අධිකරණයේ ස්වාධීනත්වය කිසිදු බාධාවකින්, අවහිරයකින් හෝ මැදිහත්වීමකින් තොරව ආරක්ෂා කළ යුතු වන්නේ ය. යුක්තිය සාධාරණව හා අපක්ෂපාතීව ඉටු කිරීම සහතික කිරීමේදී අධිකරණය වැදගත් කාර්යභාරයක් ඉටු කරන අතර, එහි ස්වාධීනත්වයට සිදුවන ඕනෑම මැදිහත්වීමක් මඟින් අධිකරණ පද්ධතියේ සුපිළිපන්නභාවය කෙරෙහි හානි කළ හැකි වේ. සමාජයේ ප්‍රමාණවත් ක්‍රියාකාරිත්වය සඳහා මෙම කරුණු දෙක අතර සියුම් සමතුලිතතාවයක් ඇති කර ගත යුතු වන්නේ ය."*

*"සිය බලතල ක්‍රියාත්මක කරන අතරතුර, රජයේ මෙම අංශ තුනම විසින් තෘප්තිමත් හැඟීමක් අත්විඳිය හැකි නමුත්, තම බලතල අධික ලෙස හෝ අසාධාරණ ලෙස භාවිතා කිරීම පිළිගත නොහැකි බව ඔවුන් විසින් සිහි තබා ගත යුතු වන්නේ ය.* ***"යෝධයෙකුගේ ශක්තිය තිබීම විශිෂ්ට වේ; එනමුත් එය යෝධයෙකු මෙන් එම ශක්තිය භාවිතා කිරීම කුරිරු ක්‍රියාවකි"*** *(විලියම් ෂේක්ස්පියර්, ඔහුගේ Measure for Measure, Act 2, Scene 2) යන කියමන මඟින් බලයේ සිටින පුද්ගලයින් තම ක්‍රියාවන් මඟින් සමාජයට ඇති කරන බලපෑම ගැන සැලකිලිමත් විය යුතු බවත්, පුද්ගලික වාසි සඳහා හෝ අන් අයව පීඩාවට පත් කිරීම සඳහා සිය බලතල භාවිතා නොකළ යුතු බවත්, යහපත සැලසීම උදෙසාම පමණක් එම බලතල භාවිතා කළ යුතු බවත් සිහිපත් කරනු ලැබේ . ………". (@ -94-96 pp)*

ඉහත දක්වා ඇති නීති විද්‍යාව මත පදනම්ව, අධිකරණයේ ස්වාධීනත්වය බලතල බෙදීමේ මූලධර්මය යටතේ ස්ථාවරව ස්ථාපිත කර ආරක්ෂා කර ඇති බව පැහැදිලි වේ. ඒ අනුව, අධිකරණ සේවා කොමිෂන් සභාවේ කටයුතු මඟින් ජනතාවගේ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම පිළිබිඹු කෙරෙන අතර, ව්‍යවස්ථාදායකය හෝ විධායකය විසින් සිදු කරනු ලබන ආක්‍රමණයන්ට එරෙහිව එම ආරක්ෂාවම අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් භුක්ති විඳිනු ලැබේ.

ජනතාවගේ අධිකරණ බලයේ දිගුවක් ලෙස සලකමින් අධිකරණ සේවා කොමිෂන් සභාව පිළිබඳව සහ එහි කාර්යය ආරක්ෂා කිරීම සඳහා බලතල බෙදීමේ මූලධර්මය මඟින් පනවා ඇති සීමාවන් පිළිබඳව පරීක්ෂා කිරීමෙන් අනතුරුව, ස්ථාවර නියෝග 27(3) යටතේ මාගේ රාජකාරිය වෙත මම අවධානය යොමු කරමි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ ක්‍රියාකාරිත්වය සහ මෙහෙයුම් අධීක්ෂණය කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කිරීම සඳහා පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මා ඉදිරියේ ඇති යෝජනාව මඟින් අපේක්ෂා කරනු ලැබේ . එවැනි යෝජනාවක් න්‍යාය පත්‍රයට ඇතුළත් කළ යුතු බවට තීරණය කිරීමේ සහ එය රීතියට අනුකූල හෝ රීති විරෝධී බව තීරණය කිරීමේ අභිමතය, ස්ථාවර නියෝග 27(3) යටතේ, කථානායකවරයා ලෙස මා සතු වේ. යෝජනාවේ අරමුණු ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලද යන්න, මෙම අභිමතය ක්‍රියාත්මක කිරීමේ දී, මා විසින් තීරණය කළ යුතු වේ.

මාගේ මතයට අනුව, ව්‍යවස්ථාදායක බලය ක්‍රියාත්මක කිරීමේදී, බලතල බෙදීමේ මූලධර්මයට තර්ජනයක් වන ඕනෑම යෝජනාවක්, ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අවමන් කිරීමක් වේ.

එබැවින්, පහත සඳහන් හේතු මත, අධිකරණ නිලධාරින් පත් කිරීම, උසස් කිරීම, මාරු කිරීම, සේවයෙන් පහ කිරීම සහ ඔවුන් විෂයෙහි විනය පාලනය සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාවේ බලතල පරීක්ෂා කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කිරීම සඳහා 2025 නොවැම්බර් 21 වන දින ඉදිරිපත් කරන ලද යෝජනාව, **රීති විරෝධී** බව මාගේ තීරණයයි:—

1. අධිකරණ සේවා කොමිෂන් සභාවේ කාර්යයන් සහ අරමුණු මඟින් ජනතාවගේ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම පෙන්නුම් කරනු ලබන අතර, එසේ හෙයින් ඒවා අධිකරණයේ ස්වාධීනත්වය සඳහා වන ව්‍යවස්ථාමය ආරක්ෂාව භුක්ති විඳියි;

2. අධිකරණ සේවා කොමිෂන් සභාවේ මෙහෙයුම් අධීක්ෂණය කිරීම මඟින් එම බලය ආක්‍රමණය කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් පාර්ලිමේන්තුවට ඉඩකඩ ලබා දෙනු නොලැබේ. මෙම තහනම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 3 ව්‍යවස්ථාවේ දක්වා ඇති බලතල බෙදීමේ මූලධර්මය මඟින් ශක්තිමත් කරනු ලැබේ;

3. ජනතාව විසින් විශ්වාසය මත පාර්ලිමේන්තුව වෙත පවරා ඇති රජයේ අරමුදල්වල භාරකාරත්වය මඟින් භාරකාර වගකීමක් මිස ධුරාවලි ආධිපත්‍යයක් පැවරීමක් සිදු නොවන අතර, ව්‍යවස්ථාපිත බලතල බෙදා හැරීම කෙරෙහි බාධා කිරීම සාධාරණීකරණය කළ නොහැක; සහ

4. අධිකරණ සේවා කොමිෂන් සභාවේ කාර්යයන් හෝ තීරණ විමර්ශනය කිරීමට, අධීක්ෂණය කිරීමට හෝ සමාලෝචනය කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් පාර්ලිමේන්තුවට බලය ලබා දෙනු නොලැබේ.

අධිකරණ සේවා කොමිෂන් සභාවට අදාළ කරුණු පරීක්ෂා කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කිරීම අධිකරණයේ ස්වාධීනත්වය හානියට ලක් කිරීමක් වන අතර

එමඟින් ජනතාවගේ අධිකරණ බලය හානියට ලක් වේ. මෙම දීර්ඝ තීරණය ඉවසිලිවන්තව හා අවධානයෙන් යුතුව අසා සිටීම සම්බන්ධයෙන් මෙම සභාවේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ට මගේ අවංක කෘතඥතාව පළ කරමි. අපගේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය සහ මෙම උත්තරීතර සභාවේ අභිමානය ශක්තිමත් කරනු ලබන මෙම දීර්ඝ තීරණය ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු ඉතිහාසයේ සංධිස්ථානයක් ලෙස පවතිනු ඇතැයි මම විශ්වාස කරමි.”

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 35 දරන රේගු (සංශෝධන) පනතින් සහ 1988 අංක 83 දරන රේගු (සංශෝධන) පනතින් සංශෝධිත (235 වැනි අධිකාරය වූ) රේගු ආඥාපනතේ 19(අ) වගන්තිය යටතේ රේගු ආනයන තීරු බදු සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 නොවැම්බර් 11 දිනැති අංක 2462/09 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය ඉදිරිපත් කරන ලදී.

එම ලිපිලේඛනය, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ සංචාරක අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2024 වර්ෂය සඳහා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2021 සහ 2022 වර්ෂ සඳහා තල් සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කර, එම වාර්තා පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා වාණිජ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2024 වර්ෂය සඳහා ගුවන්තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් —

(i) 2015 වර්ෂය සඳහා සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ වාර්ෂික වාර්තාව;

(ii) 2023 වර්ෂය සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව;

(iii) 2024 වර්ෂය සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(iv) 2024 වර්ෂය සඳහා රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** (1) කම්කරු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති, ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද (129 අධිකාරය වූ) සාප්පු සහ කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය සහ වේතන විධිමත් කිරීමේ) පනතේ 66 වගන්තිය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් 2025 දෙසැම්බර් 12 දින සාදන ලද නියෝගය සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති වෙනුවෙන් එහි සාමාජික මන්ත්‍රිනී, ගරු එම්. ඒ. සී. එස්. චතුරි ගංගානි මහත්මිය විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) 2022 හා 2023 වර්ෂ සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තා;

(ii) 2020/2021 හා 2022/2023 වර්ෂ සඳහා සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ වාර්ෂික වාර්තා;

(iii) 2020/2021 හා 2021/2022 වර්ෂ සඳහා සීමාසහිත ලංකා පොහොර සමාගමේ වාර්ෂික වාර්තා;

(iv) 2023 හා 2024 වර්ෂ සඳහා ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා;

(v) 2023 හා 2024 වර්ෂ සඳහා ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා;

(vi) 2023 හා 2024 වර්ෂ සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා;

(vii) 2021, 2022 හා 2023 වර්ෂ සඳහා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තා; සහ

(viii) 2021 වර්ෂය සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(3) ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති, ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය වෙනුවෙන් එම කාරක සභාවේ සාමාජික මන්ත්‍රී ගරු කන්දසාමි ප්‍රභු මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) 2023 සහ 2024 වර්ෂ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා;

(ii) 2023 සහ 2024 වර්ෂ සඳහා වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා;

(iii) 2023 සහ 2024 වර්ෂ සඳහා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා;

(iv) 2023 සහ 2024 වර්ෂ සඳහා තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා;

(v) 2023 සහ 2024 වර්ෂ සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා;

(vi) 2023 සහ 2024 වර්ෂ සඳහා නීති කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා;

(vii) 2023 සහ 2024 වර්ෂ සඳහා කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයේ කාර්ය සාධන වාර්තා;

(viii) 2023 සහ 2024 වර්ෂ සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා;

(ix) 2023 සහ 2024 වර්ෂ සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා; සහ

(x) 2023 සහ 2024 වර්ෂ සඳහා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**4. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) පතන, ජයසිරිපුර, අංක 64 දරන ස්ථානයෙහි පදිංචි එස්.ඒ. කන්දසාමි නයිදු මහතාගෙන් ලැබුණු 2025.11.17 දිනැති පෙත්සම ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) පෝරුවදණ්ඩ, පැල්පිටිගොඩ, අංක 32/ඒ 2 දරන ස්ථානයෙහි පදිංචි ජේ.ඩී. නෙලූකා දිල්ශානි මහත්මියගෙන් ලැබුණු 2025.07.28 දිනැති පෙත්සම;

(ii) වලගෙදර, ගල්මත්ත, මැටියමුල්ල, අංක 274 දරන ස්ථානයෙහි පදිංචි කේ.වී. රිද්මා සඳරුවනි මහත්මියගෙන් ලැබුණු 2025.07.28 දිනැති පෙත්සම;

(iii) ඉංගිරිය, මහ ඉංගිරිය, ඉමගිර ජනපදය, අංක 1002 දරන ස්ථානයෙහි පදිංචි එම්.එච්. අනුෂා ප්‍රියංගනි මහත්මියගෙන් ලැබුණු 2025.07.28 දිනැති පෙත්සම; සහ

(iv) වැල්මිල්ල හංදිය, වැල්මිල්ල, මෛත්‍රී මාවත, පළමු පටුමග, අංක 151, දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.ඒ.ආර්. නිසංසලා මහත්මියගෙන් ලැබුණු 2025.07.28 දිනැති පෙත්සම

ගරු අජිත් පී. පෙරේරා මහතා විසින් පිළිගන්වන ලදී.

(3) ගනේමුල්ල, කටුවාමුල්ල, අංක 64/2 දරන ස්ථානයෙහි පදිංචි එච්.ආර්. චාන්දනී පීරිස් මෙනෙවියගෙන් ලැබුණු 2025.12.18 දිනැති පෙත්සම ගරු චානක මාදුගොඩ මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. පාර්ලිමේන්තුවේ වැඩකටයුතු:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා වෙනුවෙන්, කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— අද දින ආණ්ඩුවේ වැඩකටයුතු මුඛ්‍යස්ථානය ගත යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. සාප්පු සහ කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය සහ වේතන විධිමත් කිරීමේ) පනත යටතේ නියෝගය:** කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— (129 අධිකාරය වූ) සාප්පු සහ කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය සහ වේතන විධිමත් කිරීමේ) පනතේ 66 වගන්තිය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් 2025 දෙසැම්බර් 12 දින සාදන ලදුව, 2025.12.18 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අ.භා. 12.03 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.00 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරිය මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි:** අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය වෙනුවෙන් කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 දෙසැම්බර් 01 දිනැති අංක 2465/07 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.12.19 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

"ගරු ඉම්රාන් මහරූෆ් මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.14 ට ගරු ඉම්රාන් මහරූෆ් මහතා මූලාසනාරූඪ විය.)

"ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි බලශක්ති අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 4.18 ට ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. කල් තැබීම:** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය" යි කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුයෙන්, අ.භා. 5.34 ට මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින්, අද දින සභා සම්මතිය අනුව පාර්ලිමේන්තුව කල් තබන ලදී.

ඊට අනුකූලව, පාර්ලිමේන්තුව 2026 ජනවාරි 20 අඟහරුවාදා පූ.භා. 9.30 වනතෙක් කල් ගියේ ය.